A සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education Southern Province Department of Education Southern Province
தென் மாகாணக் கல்வித் திணைக்களம் தென் மாகாணக் கல்வித் திணைக்களம்

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Department of Education, Southern Province

66 | S | II

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය – දෙවන වාර පරීක්ෂණය – 2019 මාර්තු**

கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்

**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

**13 ශ්‍රේණිය**
**Grade 13**

**ජෛව පද්ධති තාක්ෂණවේදය – I**
**Bio Systems Technology- I**

**පැය දෙකයි**
**Two hours**

**සැලකිය යුතුයි :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(01) සටහන් නොවන වර්ෂාමානය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. වර්ෂාමානය ස්ථාපනය පෙර එහි කුණුරොඩු, දූවිලි ආදිය ඇත්නම් ඉවත් කළ යුතුය
2. වැසි ජලය රැස්වන බඳුනේ කාන්දු වීම් ඇත්දැයි පරීක්ෂා කළ යුතුය
3. පොළොව මට්ටමේ සිට වර්ෂාමානයේ පුනීල කටට උස 25cm ක් විය යුතුය.
4. සිමෙන්ති වේදිකාවක් මත ස්ථාපනය කළ යුතුය
5. බාහිර බාධක ඇත්නම් ඒවායේ උස මෙන් දෙගුණයක දුරින් ස්ථාපනය කළ යුතුය

(02) පසේ ඇලෙන සුළු ස්වභාවය (Stickness) නිර්ණය කිරීමේදී පහත රූප සටහන අනුව ඔබ නිගමනය කරනුයේ,



1. අලෙන සුළු නොවන පසක් බවයි
2. මදක් ඇලෙන සුළුපසක් බවයි
3. ඇලෙන සුළු පසක් බවයි
4. ඉතා ඇලෙන සුළු පසක් බවයි
5. නිගමනයකට එළඹීමට දත්ත ප්‍රමාණවත් නොවන බවයි

(03) මජ්ජා ජීවීන් පමණක් අඩංගු වර්ණය වන්නේ,
1. ගොළුබෙල්ලා, ගැඩවිලා
2. දිලීර, ප්‍රොටෝසෝවා
3. ලයිකන, ප්‍රොටෝසෝවා
4. ඇල්ගී, මයිටාවා
5. ලයිකන. මයිටාවා

(04) ස්ටොක්ගේ නියමය මූලධර්මය ලෙස පදනම් කරගත් පාංශු වයනය සෙවීමේ ක්‍රමය වනුයේ,
1. රෝල් ක්‍රමය
2. ද්‍රවමාන ක්‍රමය
3. ස්පර්ශ ක්‍රමය
4. B.D.H ක්‍රමය
5. වයන ත්‍රිකෝණ ක්‍රමය

(05) පස් නියැදි කිහිපයක පාංශු වර්ණය නිර්ණය කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කරන ලද ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - අළු පැහැති පසෙහි ජල වහනය දුර්වලය
B - කළු පැහැති පසෙහි කාබනික ද්‍රව්‍ය වැඩිය
C - රතු පැහැති පසෙහි ජල වහනය මනා ලෙස සිදු නොවේ

ඉහත ප්‍රකාශවලින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වනුයේ
1. A පමණි
2. B පමණි
3. A හා B පමණි
4. A හා C පමණි
5. A, B හා C පමණි

(06) බිම් මැනීමේදී සිදුකරන කෝණික මිනුම් පිළිබඳව නිවැරදිව ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.

1. සරල බිම් මැහුම් ක්‍රියාවලියකදී පවා රේඛීය මිනුම් පමණක් ප්‍රමාණවත් නොවන විටකදී යොදා ගනී.
2. අවරෝහණ කෝණ දෘෂ්ටි රේඛාවේ සිට ඉහළට $00^{0}00'00''$ ලෙස මැනිය හැක.
3. කෝණ මැනීමේදී අනුයාත මැනුම් ලක්ෂ 2ක් ඔස්සේ දුරේක්ෂය භ්‍රමණය කිරීමෙන් අන්තර්ගත හා උත්ක්‍රම කෝණ මැනිය හැක.
4. සිරස් තලයේ කෝණ මැනීම සඳහා ප්‍රිස්ම මාලිමාව යොදා ගත හැක.
5. නිශ්චිත දිශාවකට සාපේක්ෂව සිරස් තලයේ දක්ෂිණාවර්තව මනින ලද කෝණය දිගාංශය ලෙස හඳුන්වයි.

(07) මට්ටම් ගැනීම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. මට්ටම් සෙවීමේ ස්ථාන 2ක අතර දුර 100mට වඩා අඩු වූ විට පමණක් සරල මට්ටම් ගැනීමේ නිරවද්‍යතාව වැඩි කර ගත හැක.

B. පරික්‍රමණ මට්ටම් ගැනීමේදී උපකරණ පිහිටුම් ස්ථාන කිහිපයක් තිබිය හැක.

C. පරික්‍රමණ ක්‍රමයේදී අතරමැදි පාඨාංක කිහිපයක් අත්‍යවශ්‍ය වේ.

නිවැරදි ප්‍රකාශය අඩංගු වරණය,

1. A පමණි 2. C පමණි 3. A හා C පමණි
4. A හා B පමණි 5. A, B, C සියල්ලම

(08) සමෝච්ච රේඛා පිලිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. කඳු වැටියක් නිරූපණය කරන සමෝච්ච සිතියමක "V" හැඩැති සමෝච්ච රේඛා පොළොව දෙසට පහත් අගයක් ලෙස පෙන්වයි.
2. පොළොව දෙසට උත්තල පිහිටන සමෝච්ච රේඛා මඟින් කඳු වැටියක් නිරූපණය කෙරේ
3. අනුයාත සමෝච්ච රේඛා දෙකක් අතර තිරස් දුර නියතයකි
4. ඒකාකාරී දුරකින් ඉතා සමීපව පිහිටන සමෝච්ච රේඛා මඟින් තැනිතලා නිරූපණය කරයි.
5. සමීපව පිහිටි සංවෘත රේඛා ශ්‍රේණියෙන් දැක්වෙන සිතියමක මධ්‍යයේ ඉහළ අගයක් නම් කන්දක් ද අඩු නම් අවපාතයක් ද පෙන්නුම් කරයි.

(09) , (10) ප්‍රශ්න සඳහා පහත රූප සටහන් උපයෝගී කරගන්න.


A


B


C

(09) ඉහත රූපසටහනකින් දැක්වෙන A, B, C යන උපකරණයන්හි නම් නිවැරදිව දැක්වෙන වරණය වනුයේ,

1. ප්‍රිස්ම මාලිමාව, GPS, දෘෂ්ටි චතුරස්‍රය 2. GPS , මාලිමාව, මැප් මීටරය
3. GIS, ප්‍රිස්ම මාලිමාව, දෘෂ්ටි චතුරස්‍රය 4. GPS, දෘෂ්ටි චතුරස්‍රය, මැප් මීටරය
5. මැප් මීටරය, දෘෂ්ටි චතුරස්‍රය, ප්‍රිස්ම මාලිමාව

- **A, B හා C උපකරණයන්හි භාවිතයන් පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.**

A - ස්ථානයක සාපේක්ෂ පිහිටීම ලකුණු කිරීමේදී බණ්ඩාංකයන් හා උච්චත්වය සෘජුව ලබා ගැනීම

B - පොළොව මත අනුලම්භ නිර්මාණයේදී සෘජුකෝණී පිහිටුමක් සහිත ස්ථාන ලකුණු කිරීම

C - සිතියමක වර්ගඵලය නිර්ණය කිරීම.

(10) නිවැරදි ප්‍රකාශ සහිත වරණය වනුයේ,

1. A පමණි 2. B පමණි 3. C පමණි
4. A හා C පමණි 5. B හා C පමණි

(11) ජලය, සීමිත ප්‍රදේශයක පමණක් විහිදී භූ ජල මට්ටමට ඉහළින් පිහිටන ජලධර වර්ගය වනුයේ,
1. අනවහිර ජලධර
2. සීමා වූ ජලධර
3. අර්ධ සීමා වූ ජලධර
4. උලැඟී
5. ආර්ටිසියානු

(12) ජල සාම්පලයක විවිධ පරාමිතින් හා එම පරාමිතින්ට අනුරූප අගයයන් පහත දක්වා ඇත.
A) pH අගය - 6.5 pH
B) ආවිලතාව - NTU 5
C) කඨිනත්වය - 500mg/*l* වේ.
D) මුළු කොල්ෆෝම් බැක්ටීරියා ප්‍රමාණය- 08/100m*l* වේ.
E) මුළු ඝන ද්‍රව්‍ය ප්‍රමාණය (TSS) - 400mg/*l* වේ.
ඉහත පරාමිති අතුරින් ජලයේ ගුණාත්මකභාවය මනින රසායනික පරාමිති වන්නේ,
1. A හා B පමණි
2. A හා C පමණි
3. C පමණි
4. D හා E පමණි
5. D පමණි

(13) ජලයේ උෂ්ණත්වය පිළිබඳ වගන්ති 3ක් පහත දැක්වේ.
A) ජලයේ අඩංගු තාප ප්‍රමාණයේ මිනුමකි.
B) උෂ්ණත්වය මත ජලයේ රසායනික සහ ජෛවීය ලක්ෂණ වෙනස් වේ.
C) උෂ්ණත්වය හා ජලයේ pH අගය අගය අතර ඇත්තේ අනුලෝම සම්බන්ධතාවකි.
මින් වඩාත් නිවැරදි වන්නේ,
1. A පමණි
2. A හා C පමණි
3. B හා C පමණි
4. A හා B පමණි
5. A, B හා C සියල්ලම ය.

(14) අතු කැබලි මුල් අද්දවා ගැනීම කෙරෙහි බලපාන ස්වභාවික ශාක හෝමෝනය වන්නේ,
1. ඔක්සීන්ය.
2. ගිබරලින් අම්ලය
3. සයිටොකයිනින්ය
4. ඇබ්සිසික් අම්ලය
5. එරිත්‍රොමයිසීන්ය

(15) ශාක අතු බැඳීමේදී,
1. අත්තෙහි ඇති පත්‍ර සියල්ල ඉවත් කළ යුතුය
2. පොත්ත ඉවත් නොකළ යුතු නමුත් අත්තෙහි පත්‍රවලින් අඩක් ඉවත් කළ යුතුය
3. පොත්ත සහ අත්තෙහි පත්‍රවලින් අඩක් ඉවත් කළ යුතුය
4. මුල් ඇදීම බලාපොරොත්තු වන ස්ථානයට පහළින් පොත්ත ඉවත් කළ යුතුය
5. මුල් ඇදීම බලාපොරොත්තු වන ස්ථානයට ඉහළින් පොත්ත ඉවත් කළ යුතුය.

(16) විසිතුරු මසුන්ට රෝග ඇති කරන ප්‍රධාන කාරකයින් කිහිපයක් පහත දැක්වේ. ඒ අතරින් බැක්ටීරියා හා දිලීර රෝග කාරකයන් වන්නේ පිළිවෙලින්,
1. *Achlya, Vibrio*
2. *Limphocystis, Pseudomonas*
3. *Vibrio, Saprolegnia*
4. *Achlya, Aeromonas*
5. *Limphocystis, Saprolegnia*

(17) මඩ පොකුණු තුළ මිරිදිය මත්ස්‍යයින් වගා කිරීමේදී මත්ස්‍යයින්ට ආහාර සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් පහත දැක්වේ.
A) දිනකට දෙවරක්වත් අවම වශයෙන් ආහාර ලබාදිය යුතුය
B) පොකුණේ විවිධ තැන්වල ආහාර සැපයිය යුතුය
C) උදේ සහ සවස් කාලයේ ආහාර ලබාදිය යුතුය
D) මත්ස්‍යයාගේ දේහ බරින් 5%ක් ආහාර ලබා දිය යුතුය
මින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,
1. A, C හා D පමණි
2. A, B හා D පමණි
3. A හා B පමණි
4. A හා C පමණි
5. B හා C පමණි

(18) අර්ධ නිමග්න විසිතුරු ජලජ පැළෑටියකි.

1. *Salvinea* 2. *Nymphaea* 3. *Hydrilla*
4. *Eichronia* 5. *Pistia*

(19) දෙවීමේ යන්ත්‍රයක පසුර මගින් කෙරෙන කාර්යය නිවැරදිව සඳහන් වනුයේ,

1. විචලනය වන වායු අවශ්‍යතාව ස්වයංක්‍රීයව පාලනය කරයි.
2. පීඩනයේ අසාමාන්‍ය මට්ටම් පෙන්නුම් කරයි.
3. කිරි දෙවීමේදී තන පුඩුවලට අවශ්‍ය රිද්මයානුකුල හැකිලීම හා පුළුල් වීමේ උත්තේජනය ලබාදෙයි
4. කිරි දෙවීමේදී තන පුඩුවලට සම්බන්ධ කරයි.
5. දෙනුන්ගේ කිරි ඇද ගැනීමට අවශ්‍ය චූෂණ බලය ඇති කරයි.

(20) A - කිරිවල අඩංගු දෛහික සෛල ගණන වැඩි වන විට කිරිවල ගුණාත්මක බව වැඩිවේ.
B - සාමාන්‍යයෙන් නිරෝගී දෙනකගේ ක්ෂීරණ ග්‍රන්ථියෙහි දෛහික සෛල 1000000SEC / m*l* ට වඩා අඩු ප්‍රමාණයක් පැවතිය යුතුය

ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,

1. A පමණි 2. B පමණි 3. A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය වේ.
4. A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වේ. 5. ඉහත කිසිවක් නොවේ.

(21) අගය එකතු කළ හා විවිධාංගීකරණය කරන ලද කුකුළු මස් නිෂ්පාදන සඳහා උදාහරණ පිළිවෙලින් සඳහන් වනුයේ,

1. පදම් කළ මස්, දුම් ගැසූ මස් 2. සොසේජස්, මීට් බෝල්ස්
3. සොසේජස්, දුම් ගැසූ මස් 4. මීට් බෝල්ස්, පදම් කළ මස්
5. පදම් කළ මස්, සොසේජස්

(22) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට අනුව බිත්තර වර්ගීකරණය පිළිබඳව පහත ප්‍රකාශ සලකා බලන්න.

A - 60g හෝ ඊට වැඩි බර සහිත බිත්තර අති විශාල ශ්‍රේණිය යටතට වර්ග කෙරේ.
B - 45 - 52g බර සහිත බිත්තර මධ්‍යස්ථ ශ්‍රේණිය යටතට වර්ග කෙරේ.
C - 53 - 59g බර සහිත බිත්තර විශාල ශ්‍රේණිය යටතට වර්ග කෙරේ.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

1. A පමණි 2. B පමණි 3. C පමණි
4. A හා C පමණි 5. A, B හා C සියල්ලම

(23) බ්‍රොයිලර් මස් නිෂ්පාදනය ක්‍රියාවලිය පිළිබඳ අසත්‍ය වගන්තියක් වනුයේ,

1. සතුන් රාත්‍රී කාලයේ හෝ උදෑසන ප්‍රවාහනය කළ යුතුය
2. සතුන් හැසිරවීමේදී කකුල්වලින් හෝ පිහාටුවලින් පමණක් අල්ලා ගත යුතුය
3. ඝාතනයට පැය 8 - 24 පෙර ආහාර දීම නතර කළ යුතුය
4. සතා ඝාතනයට පෙර නොසෙල්වන පරිදි පා විලංගු යොදා රඳවා තැබිය යුතුය
5. ඝාතනයට පෙර සියලුම සතුන් බාහිර පරීක්ෂාවකට ලක් කරනු ලබයි.

(24) ආහාර නරක් වීමට උෂ්ණත්වය බලපාන ආකාරය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A) උෂ්ණත්වය වැඩි වීමේදී ආහාර තුළ ස්වභාවිකව සිදුවන රසායනික ප්‍රතික්‍රියා වේගවත් වේ.
B) ආහාර ස්වයං වියෝජනයට භාජනය වීම වේගවත් වීම නිසා ප්‍රෝටීනවල ස්වභාවය වෙනස් වීම වැනි ක්‍රියා සිදු වී පෝෂ්‍ය ගුණය වෙනස් වීම සිදුවේ.

ඉහත ප්‍රකාශ අතුරින්,

1. A නිවැරදිය
2. B නිවැරදිය
3. A සහ B දෙකම නිවැරදිය
4. A නිවැරදි වන අතර B මගින් එය තව දුරටත් පැහැදිලි කෙරේ
5. B නිවැරදි වන අතර එය A මගින් තව දුරටත් පැහැදිලි කෙරේ

(25) ආහාර නරක් වීමේදී ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනය කෙරෙහි හිතකරව බලපාන අභ්‍යන්තර සාධකයක් වන්නේ,
1. උෂ්ණත්වය
2. රසායනික ද්‍රව්‍ය
3. සාපේක්ෂ ආර්ද්‍රතාව
4. වායු සංයුතිය
5. ජල විභවය

(26) ජල විභව අගය මඟින් විවිධ ආහාර වර්ගවල ක්ෂුද්‍රජීවී ක්‍රියා සීමා කරයි. පහත ආහාර වර්ග අතුරින් අඩුම ජල විභව අගයක් ($a_w$සීමාවක්) ඇති ආහාර වර්ගය වන්නේ,
1. ජෑම්
2. වියළි පලතුරු
3. නැවුම් කිරි
4. පිටි
5. පලතුරු යුෂ සාන්ද්‍රණය

(27) ආහාර බිලාන්චිකරණය කිරීමේදී 0.1% sms (සෝඩියම් මෙටාබයිසල්ෆයිට්) භාවිත කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
1. ආහාරයේ වර්ණය ඒ අයුරින්ම රැක ගැනීමට ය.
2. ආහාරයේ රසය වැඩි කිරීමට ය
3. ආහාරයේ ජලය ඉවත් කිරීමටය
4. මාධ්‍යයේ pH අගය ස්ථාවර කිරීමටය
5. ආහාරයේ පෝෂණ ගුණය වැඩි කිරීමටය

(28) ආහාර සැකසීමේ නව ප්‍රවනතා පිළිබඳව පහත ප්‍රකාශ සලකන්න.
A) කිරිපිටි සැකසීමේදී විටමින් A හා D එකතු කිරීම
b) කිරිපිටි සැකසීමේදී බාහිරින් කැල්සියම් එකතු කිරීම
1. A හා B ක්‍රියාවලි දෙකම ආහාර ප්‍රබල කිරීම් වේ.
2. A ආහාර ප්‍රබල කිරීමකි, B ආහාර සරු කිරීමකි.
3. A ආහාර සරු කිරීමකි. B ආහාර ප්‍රබල කිරීමකි.
4. A හා B ක්‍රියාවලි දෙකම ආහාර සරු කිරීමක් වේ.
5. A හා B ක්‍රියාවලි දෙකම ආහාර පරිරක්ෂණ ක්‍රියාවලි වේ.

(29) ඉන්ද්‍රිය ගෝචරතාව ඇගයීම සඳහා යොදාගන්නා පරීක්ෂණාගාරයක තිබිය යුතු ලක්ෂණ පහත දැක්වේ. මේ අතුරින් නොගැළපෙන ප්‍රකාශය කුමක් ද?
1. ඝෝෂා සහ විවිධ ගන්ධයෙන් තොර ස්ථානයක් වීම
2. එක් එක් පුද්ගලයාට වෙන් කරන ලද ස්ථාන තිබීම
3. එම පරිසරයේ උෂ්ණත්වය 22 - 24$^0$C පමණ වීම
4. පරිසරයේ සාපේක්ෂ ආර්ද්‍රතාව 75% පමණ වීම
5. ඉදිරිපත් කරන ආහාර හැඳින්වීම සඳහා සංඛ්‍යා 3කින් යුත් කේත අංකයක් යොදා ගැනීම

(30) රික්තක ඇසුරුම්කරණය භාවිතයේදී ආහාරයේ,
1. තෙතමනය සම්පූර්ණයෙන්ම ඉවත් වේ.
2. ආහාර මෘදු බවට පත් වේ.
3. ශුද්ධ පරිමාව වැඩිවේ
4. ආයු කාලය වැඩිවේ
5. ඔක්සිකරණයට ලක්වේ.

(31) යම් ආහාරයක් පරිභරණයේදී භෞතික ආපදාවක් ඇති කිරීමට හේතු වන්නේ,
1. ඊයම්
2. වීදුරු කැබලි
3. ක්ෂුද්‍ර ජීවීන්
4. රසකාරක
5. විකිරණ

(32) වී වියළීම සම්බන්ධ පහත ප්‍රකාශ මත මෙම ප්‍රශ්නය පදනම් වේ.
A - ආසියාවේ බහුලවම භාවිත කරන වී වියළීමේ ක්‍රමය වන්නේ සූර්යය තාප වියළීමේ ක්‍රමයයි
B - වී වියළීමේදී එකවරම තෙතමනය ප්‍රතිශතය වැඩි කිරීම සිදු කෙරෙන නිසා පිරුනු ඇට සහිත සහල් ප්‍රතිශතය වැඩි කරගත හැකිය.
C - යාන්ත්‍රික වී වියළීම සඳහා උණුසුම් වායු ධාරා සහිත වියළන භාවිත කෙරේ
ඉහත ඒවායින් සත්‍ය / ප්‍රකාශය වන්නේ
1. A පමණක් සත්‍ය වේ
2. B පමණක් සත්‍ය වේ.
3. A හා C පමණක් සත්‍ය වේ.
4. A හා B පමණක් සත්‍ය වේ.
5. B හා C පමණක් සත්‍ය වේ.

(33) පහත රූප සටහනෙහි දක්වා ඇති මත්ස්‍යයෙකුගේ බාහිරින් නිරීක්ෂණය කළ හැකි කොටස් අතුරින් A, B, C කොටස් පිළිවෙලින් දක්වා ඇත්තේ,




1. පෘෂ්ඨීය වරල, ලය වරල, පෞච්ඡ වරල
2. පෘෂ්ඨීය වරල, ශ්‍රෝණි වරල, පෞච්ඡ වරල
3. පෘෂ්ඨීය වරල, ශ්‍රෝණි වරල, ගුද වරල
4. පෞච්ඡ වරල, ලය වරල, ගුද වරල
5. ශ්‍රෝණි වරල, ලය වරල, පෞච්ඡ වරල

(34) ආරක්ෂිත ගෘහයක් ඉදිකිරීම පිළිබඳව කර ඇති පහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය ප්‍රකාශය වනුයේ,
1. පහතරට තෙත් කලාපය සඳහා පූර්ණ ලෙස ආවරණය කළ ගෘහයක් සුදුසු වේ.
2. සෙවණ සහිත ස්ථානයක වුවද ගෘහය ඉදිකිරීම සිදු කළ හැක.
3. දිවා කාලය මුළුල්ලේම ආලෝකය ලබාගත හැකි පරිදි ගෘහය ඉදි කළ යුතුය
4. සුළං අධික ස්ථාන වල ගෘහය ඉදි කිරීම කිසිසේත්ම නොකළ යුතුය.
5. ගෘහය තුළ බෝග වගා කිරීමට කෘත්‍රිම මාධ්‍ය පමණක් භාවිත කිරීම සුදුසු වේ.

(35) ආරක්ෂිත ගෘහය තුළ ආලෝක තීව්‍රතාව ප්‍රශස්ත මට්ටමට වඩා අඩු වූ විය, එය යාමනය කිරීම සඳහා
1. ආලෝකය පරාවර්තනය කරන වසුන් යොදා ගනී.
2. තද පැහැ දැල් යොදා ගනී
3. පැළවල ඝනත්වය වැඩි කරයි.
4. ගෘහය අවට සෙවණ ගස් වගා කරයි.
5. රතු පැහැ වසුන් යොදා ගනී

The National e-Learning Portal for the General Education

(36) ඉහත A, B, C වලින් දක්වා ඇති උපකරණ පිළිවෙලින් දක්වා ඇත්තේ,


A


B


C

1. රොටවේටරය, ඇලි මැටි දමනය. ජපන් පරිවර්ත්‍ය නගුල
2. කොකු නගුල, උප පස් නගුල, හැඩ ලැලි නගුල
3. කොකු නගුල, තැටි නගුල, හැඩලැලි නගුල
4. රොටවේටරය, ඇලි වැටි දමනය, හැඩලැලි නගුල
5. දැති පෝරුව, උපපස් නගුල, ජපන් පරිවත්‍ය නගුල

(37) බිංදු ජල සම්පාදන පද්ධතියකට අයත් උපාංග කිහිපයක් පහත දැක්වේ.

A - ජල පොම්පය
B - පීඩන මාපකය
C - ජල පෙරනය
D - පොහොර ඒකකය

මේවායින් ප්‍රධාන පාලක ඒකකයට අයත් උපාංග පමණක් අයත් වන්නේ,

1. A හා B පමණි
2. B හා C පමණි
3. C හා D පමණි
4. A හා C පමණි
5. A හා D පමණි

(38) මිරිස් වගා භූමියකට දිනකට සැපයිය යුතු ජල ප්‍රමාණය 2500$l$ ක් වන අතර, පොම්පය මඟින් එම ජලය පැය දෙකක් පුරා පොම්ප කළ යුතු නම්, එම පොම්පයේ විසර්ජනය සීඝ්‍රතාවය කොපමණද?

1. 1000 $l$/h
2. 1250$l$/h
3. 1500$l$/h
4. 1750$l$/h
5. 2500$l$/h

(39) එන්ජිමක ඇතුළත් කොටසක් වන කපාට, විවෘත කිරීම හා වැසීම සඳහා භාවිතවන උපාංගය වන්නේ,

1. සබැඳුම් දණ්ඩ
2. දඟර කඳ
3. කැම් දණ්ඩ
4. ජව රෝදය
5. පිස්ටනය

(40) ට්‍රැක්ටරයක ද්‍රාව පාලන පද්ධතියෙහි ප්‍රධාන කාර්යය වන්නේ,

1. වැඩි කාර්යක්ෂමතාවයක් ඇති උෂ්ණත්ව පරාසයක එන්ජිමක පවත්වා ගැනීම
2. බලය සම්ප්‍රේෂණය කිරීම
3. ස්නේහක තෙල් ඔක්සිකරණය වීම වැළැක්වීම
4. කෘෂි යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක කරවා ගැනීම
5. එහි අන්තරය මඟින් රෝද සඳහා ශක්තිය මුදා හැරීම

(41) නැප්සැක් දියර ඉසින යන්ත්‍රයක නැසින්න මගින් දියර ඉසින පළල 75cm ක්ද මිනිත්තුවක් තුළදී යන්ත්‍රය ක්‍රියාකරන්නා ඇවිදින දුර 15mක් ද නම් හෙක්ටයාර එකක කුඹුරකට පළිබෝධනාශක ඉසීම සඳහා ගතවන කාලය මිනිත්තු කොපමණ ද?

1. 14
2. 15
3. 88
4. 888
5. 8888

(42) ට්‍රැක්ටරවල පවතින විවිධ පද්ධති හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A - ද්විරෝද ට්‍රැක්ටරයේ ඉන්ධන පද්ධතියෙහි ප්‍රාථමික හා ද්විතියික ලෙස පෙරනයන් දෙකක් ඇතුළත් වේ.

A - ජ්වලන පද්ධතියෙහි ක්‍රියාකාරීත්වයට අවශ්‍ය විදුලිය සැපයිම බැටරියෙන් සිදු කෙරේ.

A - වාතය පිරිසිදු කර සිලින්ඩරය තුළට සැපයීම වායු ශෝධකය මඟින් සිදු කෙරේ.

මේවායින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

1. A පමණි
2. B පමණි
3. C පමණි
4. A හා B පමණි
5. B හා C පමණි

(43) ශාක ස්‍රාවයක් වන රබර් කිරි රැස් කිරීමේ ක්‍රමයේ පියවර අතුරින් නිවැරදි පියවරක් නොවන්නේ,

1. කිරි කැපීම ආරම්භයේදී ගසේවට ප්‍රමාණය 50cm ට වඩා වැඩිවිය යුතුය.
2. පොළොවේ සිට 120m උසින් $40^0$ ආනතියකින් ප්ලෝයම පටකය දක්වා කැපුම යෙදිය යුතුය
3. කැපුම කදේ වට ප්‍රමාණයේ 1/2ක් පමණ දුරට සිදු කිරීම
4. රබර් කිරි කැපීම උදෑසනම සිදු කිරීම
5. වර්ෂා කාලයේදී වර්ෂා ආවරණයක් සවි කිරීම

(44) දැව වර්ගීකරණයේ දී අධි සුඛෝපභෝගී පන්තියට වර්ගකරණ දැව වන්නේ,

1. තේක්ක, කළුවර
2. කොස්, කොහොඹ
3. හල්මිල්ල, සූරියමාර
4. බුරුත, ගම්මාලු
5. මූනමල් , කුඹුක්

(45) වාෂ්පශීලි නොවන තෙල් වර්ගය වන්නේ,

1. කුරුඳු තෙල්
2. කරඳමුංගු තෙල්
3. පැඟිරි තෙල්
4. ඔලිව් තෙල්
5. රෝස තෙල්

(46) කළු ගම්මිරිස් සැකසීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

A. හොඳින් ඉදුණු එලවලින් සකසා ගනී.

B. උණු ජල ප්‍රතිකාරකය කළ ගම්මිරිස්වල තෙතමනය 75%ක් පමණ වේ.

C. ගම්මිරිස් හිරු එළියේ වියළීම මඟින් උසස් ප්‍රමිතියෙන් යුතු නිෂ්පාදනයක් ලබාගත හැක.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

1. A පමණක් සත්‍ය වේ
2. B පමණක් සත්‍ය වේ
3. C පමණක් සත්‍ය වේ
4. A හා B පමණක් සත්‍ය වේ
5. B හා C පමණක් සත්‍ය වේ.

The National e-Learning Portal for The General Education

(47) රබර් වල්කනයිස් කිරීමට භාවිත කරන රසායනිකය / මූලද්‍රව්‍යය වන්නේ,

1. Zn  2. Cu  3. S  4. HCl  5. $ZnCl_2$

(48) 330Ω හා 1KΩ යන ප්‍රතිරෝධතා අගයයන් ලබා ගැනීම සඳහා සුදුසු ප්‍රතිරෝධ යුගලය නිරූපණය කරනු ලබන වර්ණය වනුයේ,

1. 


2. 


3. 


4. 


5. 


(49) A, B හා C යන සංකේතවලින් දක්වෙනුයේ ඉලෙක්ට්‍රොනික පරිපථවල භාවිත කරන උපාංග කිහිපයකි. A, B හා C පිළිවෙලින් දක්වෙනුයේ,



A



B




C

1. ආලෝක විමෝචක ඩයෝඩයක්, ට්‍රාන්සිස්ටරයකි, ධාරිත්‍රකයකි.
2. ආලෝක විමෝචක ඩයෝඩයක්, කාරක වර්ධකයක්, ක්ෂුද්‍ර සැකසුම් පද්ධතියකි
3. සෙනෙර් ඩයෝඩයක්, සංගෘහිත පරිපථයකි, ක්ෂුද්‍ර සැකසුම් පද්ධතියකි
4. සෙනෙර් ඩයෝඩයක්, සංගෘහිත පරිපථයකි, පිළියවනයකි
5. සෙනෙර් ඩයෝඩයකි, ක්ෂුද්‍ර පාලක පද්ධතියකි, සංගෘහිත පරිපථයකි.

(50) ආපදා වැළැක්වීමේ ධූරාවලිය පිළිවෙලින් සඳහන් වනුයේ,

1. ඉවත් කිරීම, ඉංජිනේරු ක්‍රියාමාර්ග ගැනීම, විකල්ප භාවිතය, පරිපාලනමය ක්‍රියා මාර්ග ගැනීම, පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතය
2. විකල්ප භාවිතය, ඉවත් කිරීම, පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතය, ඉංජිනේරුමය ක්‍රියාමාර්ග ගැනීම, ඉවත් කිරීම
3. ඉවත් කිරීම, විකල්ප භාවිතය, ඉංජිනේරුමය ක්‍රියාමාර්ග ගැනීම, පරිපාලන ක්‍රියාමාර්ග ගැනීම, පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතය
4. පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතය, පරිපාලනය ක්‍රියාමාර්ග ගැනීම, විකල්ප භාවිතය, ඉංජිනේරුමය ක්‍රියාමාර්ග ගැනීම,ඉවත් කිරීම
5. පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතය, ඉවත් කිරීම, විකල්ප භාවිතය, ඉංජිනේරුමය ක්‍රියාමාර්ග ගැනීම, පරිපාලනය ක්‍රියාමාර්ග ගැනීම

The National e-Learning Portal for the General Education